82

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය

ශාස්ත්‍රවේදී දෙවන වසර දෙවන අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2018 ජනවාරි/ පෙබරවාරි
ආර්ථික විද්‍යාව

# ECON 2210.03 - අන්තර්මධ්‍ය සාර්ව ආර්ථික විද්‍යාව

කාලය : පැය තුන (03) යි
ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

01. පරිභෝජනය පිළිබඳ සාපේක්ෂ, නිරපේක්ෂ හා ස්ථාවර ආදායම් න්‍යායන් තුලනාත්මකව සාකච්ඡා කරන්න. (ලකුණු 16 යි)

02. (i) IS වක්‍රය යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ii) IS වක්‍රය ව්‍යුත්පන්න කරන්න. (ලකුණු 06 යි)

(iii) IS වක්‍රයේ බෑවුම කෙරෙහි මතු දැක්වෙන සාධකවල බලපෑම ප්‍රස්ථාර සටහන් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(අ) ආන්තික පරිභෝජන නැඹියාව ඉහළ යාම (MPC)

(ආ) ආන්තික බදු නැඹියාව ඉහළ යාම (MPT) (ලකුණු 08 යි)

03. (i) තෙරපුම් ප්‍රතිවිපාකය යන්න හඳුන්වා එය ශුන්‍ය විය හැකි අවස්ථා පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

(ii) ඒකාබද්ධ වෙළෙඳපොළ (IS-LM) සමතුලිතයට ඉහළ සහ පහළ අසමතුලිත තත්ත්වයන්හි සිට එම සමතුලිතය කරා ගමන් කරන ක්‍රියාවලිය පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

04. (i) මුදල් වෙළඳපොළ සමතුලිත වක්‍රය සහ සමීකරණය ව්‍යුත්පන්න කරන්න. (ලකුණු 08 යි)

(ii) "මුදල් සැපයුම සහ මුදල් ඉල්ලුමේ ආදායම් සංවේදීතාව ඉහළ යාම LM වක්‍රය මත සමාන බලපෑම් ඇති කරයි." මෙම ප්‍රකාශය අදාළ ප්‍රස්ථාර සටහන් සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

05. ඒකාබද්ධ වෙළෙඳපොළකට (IS-LM) අදාළ දත්ත කිහිපයක් පහත දක්වේ. (සංඛ්‍යා රුපියල් මිලියනවලිනි.)

$C = 100 + 0.8Yd$ $\quad MD_T = 0.4Y$

$I = 150 - 12r$ $\quad MD_S = -8r$

$G = 50$ $\quad Mr = 200$

$T = 0.25Y$

$(Mr = \frac{M}{P}, \quad i = r)$

(i) මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම සහ පොළී අනුපාතිකය ගණනය කරන්න. (ලකුණු 06 යි)

(ii) පහත සිදුවීම් සමතුලිත ජාතික ආදායමට සහ පොළී අනුපාතිකයට කරනු ලබන බලපෑම ගණනය කරන්න.

(අ) පෞද්ගලික ආයෝජන රුපියල් මිලියන 100කින් ඉහළ යාම

(ආ) මූර්ත මුදල් සැපයුම රුපියල් මිලියන 50කින් පහළ යාම (ලකුණු 06 යි)

(iii) ඉහත (i) හා (ii) කොටස් ප්‍රස්ථාරිකව ඉදිරිපත් කරන්න. (ලකුණු 04 යි)

06. (i) උද්ධමනාත්මක හා අවධමනාත්මක පරතරය අතර වෙනස පහදන්න. (ලකුණු 04 යි)

(ii) "උද්ධමනාත්මක හා අවධමනාත්මක පරතරයන්හි බලපෑම නිසා දිගුකාලීන සමස්ත සැපයුම් වක්‍රය පූර්ණ අනම්‍ය ස්වරූපයක් ගනී." ඔබ එකඟ වන්නේ ද? පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iii) සමස්ත ඉල්ලුම් වක්‍රය ව්‍යුත්පන්න කර එහි විතැන් වීමට බලපාන සාධක නම් කරන්න. (ලකුණු 06 යි)

07. ආයෝජනයේ පොළී සංවේදීතාව පහළ සහ මුදල් ඉල්ලුමේ පොළී සංවේදීතාව ඉහළ අගයක් ගන්නා විට මූල්‍ය සහ ගිස්කල් ප්‍රතිපත්තිවල කාර්යක්ෂමතාව IS-LM ආකෘතිය ඇසුරින් විග්‍රහ කරන්න. (ලකුණු 16 යි)